# සීතාවක ප්‍රාදේශීය සභාව
## 2018 වර්ෂයට වාහන හා සතුන් සඳහා බදු පැනවීම.

සීතාවක ප්‍රාදේශීය සභාවේ බලතල ක්‍රියාත්මක කරන, කාර්යය කර්තව්‍ය ඉටුකරන, සීතාවක ප්‍රාදේශීය සභාවේ ලේකම් කේ.ඒ. චන්දන පද්මසිරි වන මම 1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කිය විය යුතු එම පනතේ 147 වන වගන්තිය හා 148 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පහත උප ලේඛනයෙහි දැක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදාළව නියම කර අය කිරීමට 2017/10/12 දින අංක 9259 යටතේ තීරණය කරන ලද බව මෙයින් නිවේදනය කරමි.

2017/10/12 දින,
සීතාවක ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී,

කේ.ඒ.චන්දන පද්මසිරි,
ලේකම් හා බලතල,කාර්ය,කර්තව්‍ය
ක්‍රියාත්මක කිරීමේ නිලධාරි,
සීතාවක ප්‍රාදේශීය සභාව,
හංවැල්ල

තීරණය

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 9.3 වගන්තිය සමග කිය විය යුතු එම පනතේ 147 වන වගන්තිය හා 148 වන වගන්තියෙහි විධිවිධාන ප්‍රකාරව පහත උප ලේඛනයෙහි දැක්වෙන ආකාරයට වාහන හා සතුන් පිළිබඳ වාර්ෂික බද්දක් සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය සඳහා 2018 වර්ෂයට අදාළව නියම කර අය කිරීමට මම තීරණයකරමි.

**ඉහත කී උප ලේඛනය**

| 1 වන තීරුව | 11 වන තීරුව |
|---|---|
| | බද්ද<br>රු.ශත. |
| මෝටර් රථයක්, මෝටර් කාරයක් ,මෝටර් ලොරියක්, මෝටර් බයිසිකලයක්, කරත්තයක්, ජින් රික්ෂෝවක්, බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | 25.00 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ , බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා<br>(අ) වෙළඳ කාර්ය සඳහා යොදවන්නේ නම්<br>(ආ) වෙළඳ නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් | <br><br>18.00<br>4.00 |
| සෑම කරත්තයක් සඳහා | 20.00 |
| සෑම අත් කරත්තයක් සඳහා | 10.00 |
| සෑම රික්ෂෝවක් සඳහා | 7.50 |
| සෑම අශ්වයෙකු/ පෝනියෙකු හෝ කොටළුවෙකු සඳහා | 15.00 |
| සෑම ඇතෙකු සඳහා | 50.00 |

විෂ්කම්භය අඟල් 26 නොඉක්මවන රෝද ඇති ළමා වාහන විල්බැරෝ හුදෙක් පෞද්ගලික ස්ථානවල පමණක් වෙළඳ කාර්යය සඳහා යොදවන අත්කරත්ත සහ වෙළඳ කාර්යය සඳහා නොයොදවන අත් කරත්ත මෙකී ගෙවීමෙන් නිදහස් කෙරේ.

මේ උපලේඛනයේ "වෙළඳ කාර්ය" යන්නට , විකිණීම සඳහා හෝ අන්‍යාකාරයකින් හෝ යම් වෙළඳව්‍යාපාරයක් නැතහොත් කර්මාන්තයක් සඳහා වූයම් ද්‍රව්‍ය හෝ බඩු හෝ යම් ලිඛිත නැතහොත් මුද්‍රිත ද්‍රව්‍ය ගෙන යාම හෝ ප්‍රවාහනය කිරීම ඇතුලත්වේ.

සිංහල, දෙමළ හා ඉංග්‍රිසි මාධ්‍යය වලින් පළ කරනු ලබන මෙම දැන්වීමෙහි එක් එක් භාෂා වලින් පළ කිරීමේදී යම් නොගැලපීමක් ඇතිවුවහොත් සිංහල මාධ්‍යයෙන් පළ කරන ලද දැන්වීම බලාත්මක වේ.